www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පකිස්තානය: බුෂ්ගේ සහායක මුෂාරෆ් විදුලි සංදේශ කම්කරුවන්ට එරෙහි ත්‍රස්ත උද්ඝෝෂණයක් ආරම්භ කරයි

## Pakistan: Bush ally Musharraf mounds terror campaign against telecommunication workers

**විලානි පීරිස් සහ කීත් ජෝන්ස් විසිනි**
**2005 ජුනි 18**

පකිස්තානයේ රජයට අයත් සීමාසහිත පාකිස්තාන විදුලි සංදේශ සමාගමේ (පීටීසීඑල්) මර්මස්ථානවල පාලනය අල්ලා ගැනීමට එක්සත් ජනපද පිටුබලය ලබන මිලිටරි තන්ත්‍රය යුද්ධ හමුදාවට හා අතිරේක බලඇනිවලට නියෝග කල තැන් පටන් ගත වූ දින හය තුල එම සමාගමේ කම්කරුවන් දහසකට වැඩි ගනනක් අත්අඩංගුවට ගනු ලැබ ඇත.

සමාගම පුද්ගලීකරනය කිරීමේ ආන්ඩුවේ සැලසුම්වලට එරෙහිව සටන්කාමී අරගලයක යෙදී සිටින පීටීසීඑල් සේවකයෝ වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම රාජ්‍ය ත්‍රස්ත පාලනයකට මුහුන දෙති. වාර්තාවන අන්දමට අත්අඩංගුවට ගනු ලැබූවන් රටෙහි ක්‍රියාත්මක වන කෲර ත්‍රස්ත විරෝධී නීති යටතේ රඳවා ගනු ලැබ සිටිති. වර්ජනයේ නායකයන්ව ''ත්‍රස්තවාදීන්'' ලෙස සලකා නඩු විභාග කරන බව අභ්‍යන්තර කටයුතු ඇමති අෆ්ටාබ් අහමඩ් ෂර්පාඕ සඳුදා කීවේ ය. පීටීසීඑල් කම්කරුවන්ගේ වර්ජනය ''නීති විරෝධී බව'' කී ෂර්පාඕ, ''පීටීසීඑල් සමාගම පුද්ගලීකරනය කිරීමට එරෙහිව රජයට තර්ජනය කරන්නෝ නීතියට අනුව ත්‍රස්තවාදීහු ය. ඔවුන් තම රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම් දිගට ම කර ගෙන ගියහොත් ඔවුන්ට කරදරවලට මුහුන දීමට සිදු වනු ඇත.'' යයි කීය.

අත්අඩංගුවට පත්වීම මගහැර සිටින සමහර සමිති නිලධාරීන්ගේ හා සටන්කාමී කම්කරුවන්ගේ ඥාතීන් රාජ්‍ය පැහැර ගැනීමක ස්වරූපයෙන් අල්ලාගෙන ඇති පොලීසිය හා ආරක්ෂක හමුදා සැඟවී සිටින්නවුන් යටත් වූ විට පමනක් එම ඥාතීන් නිදහස් කරන බව ඔවුන්ගේ පවුල්වලට කීහ. තම නායකයන් 29 දෙනාගෙන් 7 දෙනෙක්ම රජය භාරයේ සිටින පීටීසීඑල් වෘත්තීය සමිති ක්‍රියාකාරී කමිටුව වාර්තා කරන ආකාරයට ආරක්ෂක හමුදා අනෙකුත් කම්කරුවන්ගේ නිවෙස්වලට ගොස් ඔවුන් වහාම වැඩට නොපැමිනිය හොත් ඔවුන්ට ද ත්‍රස්ත විරෝධී චෝදනාවලට මුහුන දීමට සිදුවන බව කියා ඇත.

අවම වසයෙන් වෘත්තීය සමිති නායකයන් 28 දෙනෙක් සේවයෙන් නෙරපා ඇති පීටීසීඑල් කලමනාකාරීත්වය කම්කරුවන් වර්ජනය සමග සබඳතා අත් නොහැරිය හොත් කෙටිකාලීන කොන්ත්‍රාත්තු මත සේවයට බඳවාගෙන ඇති දහස් ගනනක් සේවයෙන් නෙරපන බවට තර්ජනය කර තිබේ.

ජුනි 11 දින සන්ධ්‍යාවේ අති විශාල ලෙස සන්නද්ධව පැමිනි ආරක්ෂක හමුදා පීටීසීඑල් සමාගමේ ආයතන අල්ලාගත් අතර එහි කම්කරුවන්ගේ රාජකාරී යුද හමුදා සංඥා බලකායන් විසින් පවරා ගනු ලැබූහ. මෙම මිලිටරි ක්‍රියාමාර්ගය සිදු වූයේ පීටීසීඑල් කොටස්වලින් සියයට 26 ක් (26%) වෙන්දේසි කරන දිනය ලෙස අද එනම් ජුනි 18 රජය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබීමෙන් යන්තම් පැය ගනනකට පසුව ය.

බහුතර කම්කරුවෝ මේ වන විට වර්ජනය අත්හැර ඇති බවත් රටෙහි ප්‍රධාන දුරකථන ජාලය තුල තව දුරටත් සංඥා බලකායේ නිලධාරීන් සේවයේ නොයෙදෙනු ඇති බවත් ආන්ඩුව හා පීටීසීඑල් කලමනාකාරිත්වය කියා සිටිති. නමුත් දිගට ම කර ගෙන යන මර්දන ධාරාව මගින් මෙය ප්‍රතික්ෂේප කරනු ලබයි.

වර්ජනය දිගට ම පැවතීම හා පුද්ගලීකරනයට එරෙහි අරගලය ''රටෙහි ප්‍රමුඛ අවශ්‍යතාවලට'' විරුද්ධ බව කියා සිටිමින් සම්ප්‍රදායිකව වැදගත් සමිතියක් වන පීටීසීඑල් විදුලි සංදේශ සේවක සංගමයේ නායකයෝ වර්ජනය පාවා දී එය ප්‍රසිද්ධියේ ප්‍රතික්ෂේප කොට ඇත.

නමුත් සම්ප්‍රදායික වෘත්තීය සමිති නායකත්වය කෙරෙහි සාමාජිකත්වයේ බලගතු අවිශ්වාසය මගින් පීටීසීඑල් කම්කරුවන්ගේ පුද්ගලීකරන විරෝධී අරගලය ආරම්භයේ සිට ම සංලක්ෂිත වී ඇත.

පීටීසීඑල් කම්කරුවන්ගේ වෘත්තීය සමිති ක්‍රියාකාරී කමිටුව පිහිටුවීම සමාගම විසින් අනියම් කම්කරුවන් සේවයේ යෙදවීමට එරෙහි වර්ජනයක ප්‍රතිවිපාක ගැන කම්කරුවන් කල පැමිනිලිවලට ප්‍රතිචාරයකි. ක්‍රියාකාරී කමිටුවේ සමහරු වෘත්තීය සමිති නිලධරයට පිටින් තෝරා පත් කර තැනැත්තන් ය.

පුද්ගලීකරන සැලසුම නිශ්චිත නොවන කාලසීමාවකට හකුලා ගැනීමට රජය එකඟ වී ඇති ය යන හා අනෙකුත් දීර්ඝකාලීන කම්කරු ඉල්ලීම්වලට පීටීසීඑල් සමාගම අර්ථභාරී සහන ලබා දී ඇතිය යන පදනම මත, පීටීසීඑල් හි ඉස්ලාමාබාද් මූලස්ථානය හා අනෙකුත් මර්මස්ථාන කම්කරුවන් විසින් දින 10ක් පුරා අල්ලාගෙන සිටීම ජූනි 3 දා වෘත්තීය සමිති හා ක්‍රියාකාරී කමිටුව විසින් අත් හැර දමනු ලැබී ය.

කෙසේ වුවද එම ''හකුලාගැනීම'' ආන්ඩුවේ කූට ප්‍රයෝගයක් පමනක් බව ඇති තරම් පැහැදිලි විය. එය එසේ වූයේ මෙම අල්ලාගෙන සිටීමට දරුනු සතුරු භාවයක් ජනාධිපති ජනරාල් පර්වේස් මුෂාරෆ්ගේ තන්ත්‍රය විසින් ප්‍රදර්ශනය කරනු ලැබ තිබීම (මුෂාරෆ් තන්ත්‍රය පීටීසීඑල් ගොඩනැගිලි වටා භටකායන් යොදවා තිබුනු අතර ක්ෂනිකව පහර දීමට ඔවුන්ට නියෝග කරනු ලැබිය හැකි බවක් ඇඟවීය) සහ පුද්ගලීකරනය දිගට ම කර ගෙන යනු ඇති බවට පුනරුච්ඡාරනය කිරීම නිසා පමනක් නො වේ, මුෂාරෆ් තන්ත්‍රයේ අධිකාරයට හා දේශපාලනික උරුමයට ද පකිස්තාන ධනපති පන්තියේ මූලික පන්ති මූලෝපාය වන රට අන්තර්ජාතික ප්‍රාග්ධනය සඳහා ලාභ ශ්‍රම තිප්පොලක් බවට පත්කිරීමට ද පීටීසීඑල් කම්කරුවන්ගේ අරගලය අභියෝගයක් වේ.

පීටීසීඑල් කම්කරුවන් මත එල්ලවන රාජ්‍ය ප්‍රහාර මධ්‍යයේ වුව ද, රටෙහි වඩාත්ම ලාභ දායී සමාගම්වලින් එකක් විකිනීම හෙලා දකීම සඳහාත් පීටීසීඑල් කොටස් රජය මගින් වෙන්දේසි කිරීම කඩාකප්පල් කිරීම සඳහාත් මහා පරිමාන විරෝධතා දියත් කිරීමට වෘත්තීය සංගම් ක්‍රියාකාරී කමිටුව ප්‍රතිඥා දෙයි. අනෙකුත් රාජ්‍ය සමාගම් ද මෙයට සහයෝගය දක්වීමේ වර්ජන ක්‍රියාත්මක කිරීමට තර්ජනය කර ඇත.

පුද්ගලීකරනය කිරීමට ඉතා ආසන්න අනෙකුත් සමාගම්වල වෘත්තීය සමිතිවලින් හා මුෂාරෆ්ට එරෙහි ධනේශ්වර දේශපාලනික විරුද්ධ පක්ෂයෙන් පැමිනි බාධා නිසා තමන් කලින් තර්ජනය කල පරිදි දුරකථන ජාලය අහුරා දැමීමට ක්‍රියාකර නැති බව ක්‍රියාකාරී කමිටුවේ සාමාජිකයෙක් කී බව ඩෝන් පුවත්පත ඊයේ වාර්තා කලා ය.

ඒ අතර ම රජය පුරසාරම් දොඩමින් සිටින්නේ කොටස් වෙන්දේසිය - මෙයට විදෙස් ටෙලිකොම් සමාගම් 6ක් හෝ ඊට වැඩි ගනනක් ලංසු ඉදිරිපත් කරනු ඇතැයි බලාපොරොත්තු වේ. -බාධාවකින් තොරව කෙරීගෙන යනු ඇති බවයි. දේශපාලන විරෝධතාවලට ප්‍රචන්ඩත්වය හා මහා පරිමානයෙන් ආරක්ෂක හමුදා බලමුලුගැන්වීම මගින් පහර දීමට මැත සතිවලදී මිලිටරි තන්ත්‍රය නිරන්තරයෙන් ක්‍රියා කර ඇත. බෙනාසීර් භුතෝගේ සැමියා අප්‍රේල් මාසයේ ආපසු පකිස්තානයට පැමිනි විට ඔහුට සුභ පැතීමෙන් භුතෝගේ පකිස්තාන ජනතා පක්ෂ ආධාරකරුවන්ව වැලැක්වීම සඳහා එම පක්ෂයේ ක්‍රියාකාරීන් දස දහස් ගනනක් රඳවා තබා ගැනීමෙන් රටෙහි ප්‍රවාහන ජාලයෙන් බොහෝ ප්‍රමානයක් වසා දැමීමටත් රජය ක්‍රියා කිරීම මෙයට උදාහරනයක් ලෙස දැක්විය හැක.

''පකිස්තානයේ විශාලතම දුරකථන සේවා සම්පාදකයාගෙන් කොටසක් පුද්ගලීකරනය කිරීම සඳහා සෙනසුරාදා පැවැත්වීමට සැලසුම් කර ඇති කොන්දේසිය වෙත සෑම දෙනාගේ ම දෑස් යොමු වී තිබේ.'' යයි ඩව් ජෝන්ස් නිව්ස්වයර්ස් වාර්තා කර ඇත. පකිස්තානය තුල සිදු වූ විශාලතම පුද්ගලීකරනය පීටීසීඑල් සමාගමේ සියයට 26ක (26%) කොටස් විකිනීම බව සඳහන් කරන ඩව් ජෝන්ස් වාර්තාව ''මෙම විකිනීම බාධාවකින් තොරව සිදු වුව හොත් රටෙහි විශාලතම තෙල් වෙලඳාම් සමාගම වන පකිස්තාන් ස්ටේට් ඔයිල් (පකිස්තාන රාජ්‍ය තෙල් සමාගම) හා එහි දෙවන විශාලතම ගවේෂන සමාගම සහ පකිස්තාන් පෙට්‍රෝලියම් ලිමිටඩ් සමාගම ම ද වැඩිකල් නොගොස් එය ම සිදුවනු ඇතැයි විශ්ලේෂකයෝ කියා සිටිය හ.'' එය වැඩි දුරටත් සටහන් කලේ ය.

පීටීසීඑල් කම්කරුවන්ට ලැබෙන සහයෝගය වැලැක්වීම සඳහා දරන කෲරතර උත්සාහයේ දී විරෝධතා ව්‍යාපාරයට සහාය නොදෙන කම්කරුවන්ට සැලකියයුතු වැටුප් වැඩි කිරීමත් (මෙය හත් වසරක් තුල ඔවුන්ගේ ප්‍රථම වැටුප් වැඩි කිරීම යි.) ලබා දී ඇති රජය හා සමාගම පුද්ගලීකරනයෙන් පසු පලමු වසර දෙක තුල කිසිදු ස්ථිර සේවකයෙකුට රැකියාව අහිමි නොවන බව ප්‍රකාශ කල අතර ස්වෙච්ඡාවෙන් විශ්‍රාම යන්නවුන්ට විවිධ පාරිතෝෂික යෝජනා කලහ. යථාර්ථය වන්නේ වර්තමාන ශ්‍රම බලකාය ඉන් අඩකට අඩු කරමින් රැකියා දහස් ගනනක් අහෝසි කිරීමට හේතුවන තාක්ෂනික හා වැඩ නීති වෙනස්කම් හඳුන්වා දීමට පුද්ගලීකරනය මගින් මාර්ගය සලසා දෙනු ඇති බව යි.

පකිස්තානය ඉහල ආර්ථික වර්ධනයක් අත් විඳිමින් සිටින බවට මුෂාරෆ් ද හිටපු ඉහල පෙලේ සිටි බැන්ක් නිලධාරියෙකු වන අගමැති ෂවුකාට් අසීස් ද පුරසාරම් දොඩන නමුදු නිල වසයෙන් ඉලක්කම් දෙකේ උද්ධමනයක් ද නිල නොවන ඉලක්කම් දෙකේ රැකියා විරහිත තත්වයක් මෙන් ම වැඩෙන දුප්පත්කම හා සමාජ ධ්‍රැවාන්තගතවීමකට ද පකිස්තානය මුහුන දෙමින් සිටී.

රාජ්‍ය නොවන සංවිධානයක් වන පකිස්තාන මානව හිමිකම් කොමිසම පෙන්වා දෙන ආකාරයට පීටීසීඑල් කම්කරුවන්ගේ අරගලය පොඩිපට්ටම් කිරීම සඳහා රජය ගෙන යන උද්ඝෝෂනයේ දී රජය ''සාහසික බලය මත විශ්වාසය තබා තිබීමට හේතුව එම කම්කරුවන්ගේ අරගලය කම්කරු පන්ති නායකත්වය

යටතේ සිදු වන පකිස්තාන පීඩිතයන්ගේ ඉස්මතුවීමකට උත්ප්‍රේරක (තල්ලුව සපයන) විභවයක් දරා සිටීම යි. එවැනි අරගලයක් මිලිටරි තන්ත්‍රයට ද නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිව්‍යුහකරනයට ද මධ්‍යම ආසියාව හා මැද පෙරදිග කලාපය තුලට එක්සත් ජනපද මිලිටරි සහ භූ දේශපාලනික බලය ව්‍යාප්ත කිරීමට වොෂින්ටනයට සහාය දෙන පකිස්තාන පාලක පන්තියේ දෙබිඩි පිලිවෙත්වලට එරෙහිව යොමු කෙරෙනු ඇත.

කෙසේ වුවද, කම්කරුවන්ගේ අපේක්ෂාවට භූතෝගේ පකිස්තාන ජනතා පක්ෂය හෝ දක්ෂිනාංශික ඉස්ලාමීය විරුද්ධත්වය වන මුටාහිඩා මජ්ලිස්-ඉ-අමාල් හෙවත් එම්එම්ඒ හෝ වෙතින් වේවා ධනේශ්වර විරුද්ධ පාර්ශවයේ නියුතුවූවන්ගෙන් ලැබෙන සහයෝගය ද උත්කර්ෂයට නංවමින් පීටීසීඑල් කම්කරුවන්ගේ අරගලය වෘත්තීය සමිති සටන්කාමීත්වය හා විරෝධතා දේශපාලනය තුලට සීමා කිරීමට වෘත්තීය සමිති හා පකිස්තාන වෘත්තීය සමිති හිමිකම් ව්‍යාපාරය වැනි සංවිධාන වග බලාගෙන ඇත.

පුද්ගලීකරනයට හා හමුදාව විසින් පීටීසීඑල් මර්මස්ථාන අල්ලා ගැනීමට විරෝධය පලකිරීම සඳහා පකිස්තාන ජනතා පක්ෂය, එම්එම්ඒ ව්‍යාපාරය සහ පකිස්තාන මුස්ලිම් ලීග නවාස් පක්ෂය (පිටුවහල් කරන ලද අගමැති නවාස් ෂරීෆ්ගේ ආධාරකරුවෝ) සහ ප්‍රධාන විරුද්ධ පක්ෂ ජූනි 13 දා පාර්ලිමේන්තුවෙන් (ජාතික නියෝජිත සභාවෙන්) පිටව ගියහ.

පීටීසීඑල් කම්කරුවන්ගේ අරගලය හරහා තමන්ට වාසි ලබා ගැනීමේ මං සොයා ඇති මෙම සංවිධාන ඉහත පරිදි ක්‍රියා කලේ එම අරගලය මුෂාරෆ්ගේ තන්ත්‍රය හා වොෂින්ටනය සමග තමන් කරන උපාමාරු දැමීම්වලට දේශපාලනිකව යටත් කරන අතර ම එය නිශ්ක්‍රීය කර දැමීමට ය.

1992 පටන් පත්වූ සෑම ආන්ඩුවකම න්‍යායපත්‍රය තුල පීටීසීඑල් සමාගම පුද්ගලීකරනය කිරීම අඩංගුව තිබුනු බැවින් පකිස්තාන ජනතා පක්ෂයේ හා පකිස්තාන මුස්ලිම් ලීග නවාස් පක්ෂයේ සාමාජිකයන්ගේ ඉවත්ව යාම මගින් තමාත් පුදුමයට පත් කරනු ලැබූ බව පුද්ගලීකරන කටයුතු පිලිබඳ ඇමති හනීස් ෂෙයික් පැවසී ය.

''පුද්ගලීකරනයට පිටුබලය සැපයූ අය ම දැන් එයට විරුද්ධ වෙති'' යයි ෂෙයික් කීවේ ය. ''දැන් පවතින එම වෙනස වන්නේ සමාගම පුද්ගලීකරනය කිරීමට යෝග්‍ය පරිසරයක් නිර්මානය කිරීමට අපගේ රජය සමත්ව තිබීම යි.''

මෙම ''පරිසරයේ''මූලික සාධකයන් වන්නේ මුෂාරෆ් තන්ත්‍රයට එක්සත් ජනපද ආන්ඩුවෙන් ලැබෙන දේශපාලනික, මූල්‍ය හා මිලිටරිමය සහයෝගය යි. පකිස්තාන කම්කරු පන්තියට එරෙහිවත් දැනටමත් පකිස්තානය තුල පවතින ප්‍රගාඪ සමාජ අසමානතාවය බරපතල කරනු ඇත්තා වූ ගිනි අවුලනසුලු සමාජ ආර්ථික න්‍යායපත්‍රයකට පිටුබලය ලබාගැනීම සඳහාත් බුෂ්ගේ සහායකයා ''ත්‍රස්තවාදයට හා කෘෘරත්වයට එරෙහි යුද්ධය'' දියත් කරමින් සිටී.

© www.wsws.org